# කාන්තාවන්ට එරෙහි ගෘහස්ථ හිංසනය පවුලේ විසංවිධානය කෙරෙහි සිදු කරන බලපෑම පිළිබඳ අපරාධ විද්‍යාත්මක අධ්‍යයනයක්

**(රත්නපුර දිස්ත්‍රික්කය ඇසුරින්)**

**ගම්පහ මුදියන්සේලාගේ හිරන්ත බුද්ධික සිරිවර්ධන**

උපදිෂ්ට ශාස්ත්‍රපති 2015

# කාන්තාවන්ට එරෙහි ගෘහස්ථ හිංසනය පවුලේ විසංවිධානය කෙරෙහි සිදු කරන බලපෑම පිළිබඳ අපරාධ විද්‍යාත්මක අධ්‍යයනයක්

## (රත්නපුර දිස්ත්‍රික්කය ඇසුරින්)

**ගම්පහ මුදියන්සේලාගේ හිරන්ත බුද්ධික සිරිවර්ධන**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපදිෂ්ට ශාස්ත්‍රපති පරීක්ෂණයේ අවශ්‍යතා

සපුරාලීම සඳහා 2015.10.08 දින ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ

නිබන්ධයයි.

## අපේක්ෂකගේ ප්‍රකාශය

මෙම ශාස්ත්‍රීය නිබන්ධය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය උදයකුමාර අමරසිංහ මහතාගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත්, මෙම පර්යේෂණය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්වවිද්‍යාලයකට හෝ ආයතනයකට හෝ වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා ද ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි.

................................ ..................................

දිනය අත්සන

# උපදේශකවරයාගේ සහතිකය

මෙම අපේක්ෂකයා විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත්, අපරාධ විද්‍යාව පිළිබඳ උපදිෂ්ට ශාස්ත්‍රපති උපාධි පර්යේෂණයේ අවශ්‍යතා සපුරාලීම සඳහා ජී.එම්.එච්. බුද්ධික සිරිවර්ධන විසින් ඉදිරිපත් කරනු ලබන මෙම පර්යේෂණ නිබන්ධය මාගේ අධීක්ෂණය යටතේ සම්පාදනය වූවක් බවත්, එය ඇගයීම් කාර්ය සඳහා විශ්ව විද්‍යාලය වෙත ඉදිරිපත් කිරීමට සුදුසු බවත් නිර්දේශ කරමි.

.................................

දිනය

..................................

උදය කුමාර අමරසිංහ

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

# පටුන

**මාතෘකාව** **පිටු අංක**


පටුන i

වගු සටහන් v

රූප සටහන් vi

ස්තුතිය vii

සාරාංශය viii

1. පළමු පරිච්ඡේදය : හැඳින්වීම 1

**1.1** හැඳින්වීම 1

**1.2** පර්යේෂණ ගැටලුව 5

**1.3** අධ්‍යයනයේ අරමුණු 6

1.3.1 ප්‍රධාන අරමුණු 6

1.3.2 සුවිශේෂී අරමුණු 6

**1.4** පර්යේෂණ ප්‍රශ්න 6

2. දෙවැනි පරිච්ඡේදයඃ සාහිත්‍ය විමර්ශණය 7

**2.1** සංකල්ප 7

2.1.1 කාන්තාව පිළිබඳ නිර්වචන 7

2.1.2 හිංසනය 8

2.1.3 ගෘහස්ථ හිංසනය 8

2.1.4 පවුල් සංස්ථාව 10

2.1.5 පවුලේ විසංවිධානය 11

2.1.6 පවුල පිළිබඳ බෞද්ධ දාර්ශනික පදනම 14

**2.2** න්‍යායයන් 18

2.2.1 හිංසනය පිළිබඳ න්‍යායයන් 18

| මාතෘකාව | පිටු අංක |
| --- | --- |


2.2.1.1 හිංසනය පිළිබඳ මනෝ විද්‍යාත්මක න්‍යාය 18

2.2.1.2 හිංසනය පිළිබඳ සමාජ විද්‍යාත්මක න්‍යාය 20

2.2.1.3 හිංසනය පිළිබඳ අපරාධ විද්‍යාත්මක න්‍යාය 20

2.2.2 ගෘහස්ථ හිංසන ක්‍රියා පිළිබඳ න්‍යායයන් 21

2.2.2.1 ගෘහස්ථ හිංසනය පිළිබඳ අපරාධ විද්‍යාත්මක න්‍යාය 21

2.2.2.2 ගෘහස්ථ හිංසනය පිළිබඳ සමාජ විද්‍යාත්මක න්‍යාය 21

2.2.2.3 ගෘහස්ථ හිංසනය පිළිබඳ සමාජ මනෝ විද්‍යාත්මක න්‍යාය 22

2.2.2.4 ගෘහස්ථ හිංසනය පිළිබඳ සම්පත් න්‍යාය 22

2.2.2.5 ගෘහස්ථ හිංසනය පිළිබඳ උප සංස්කෘතික න්‍යාය 23

2.2.2.6 ගෘහස්ථ හිංසනය පිළිබඳ මනෝ චිකිත්සන න්‍යාය 23

2.2.2.7 කාන්තාවාදී දෘෂ්ටිකෝණය අනුව ගෘහස්ථ හිංසනය විග්‍රහ කිරීම 23

2.2.3 පවුල හා පවුලේ විසංවිධානය පිළිබඳ න්‍යායයන් 25

2.2.3.1 පවුල හා පවුලේ විසංවිධානය පිළිබඳ කෘත්‍යවාදී න්‍යාය 25

2.2.3.2 පවුල හා පවුලේ විසංවිධානය පිළිබඳ ඝට්ටනවාදී දෘෂ්ටිකෝණය 27

2.2.3.3 පවුලේ විසංවිධානය පිළිබඳ කාන්තාවාදී දෘෂ්ටිකෝණය 29

2.2.3.4 පවුලේ විසංවිධානය පිළිබඳ මනෝ විද්‍යාත්මක න්‍යාය 30

**2.3** කාන්තාවන්ට එරෙහි ගෘහස්ථ හිංසනය හා පවුලේ විසංවිධානය පිළිබඳ ගෝලීය හා දේශීය පසුබිම 31

2.3.1 ගෝලීය අධ්‍යයනයන් 31

2.**3.2** ශ්‍රී ලංකාවේ ගෘහස්ථ හිංසනය පිළිබඳ පර්යේෂණ 39

**2.4** ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් පවතින නෛතික පසුබිම 43

2.4.1 ගෝලීය නෛතික පසුබිම 43

මාතෘකාව | පිටු අංක


2.4.1.1 කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ
ප්‍රකාශනය - 1993 43

2.4.1.2 කාන්තාවන්ට එරෙහි ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ
යෝජනාවලිය - 2004 44

2.4.2 ශ්‍රී ලංකාවේ පවතින නෛතික පසුබිම 44

2.4.2.1 ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සහ ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහය 45

2.4.2.2 ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත 55

3. තුන්වැනි පරිච්ඡේදය : පර්යේෂණ ක්‍රමවේදය 60

**3.1** පර්යේෂණ ක්‍රමවේදය 60

3.1.1 මූලාශ්‍රය 60

3.1.2 අධ්‍යයන ක්ෂේත්‍රය 61

3.1.3 නියැදිය 62

3.1.4 දත්ත රැස් කිරීමේ ක්‍රම 64

3.1.5 දත්ත විශ්ලේෂණය 65

**3.2** අධ්‍යයනයේ සීමා 66

4. හතරවැනි පරිච්ඡේදය : පර්යේෂණ ප්‍රතිඵලය හා සාකච්ඡාව 68

**4.1** පර්යේෂණ ප්‍රතිඵලය 68

4.1.1 පොලිස් පැමිණිලි වාර්තාවන් 68

4.1.2 සිද්ධි අධ්‍යයනයන් 73

**4.2** සාකච්ඡාව 92

**5.** පස්වැනි පරිච්ඡේදය : නිගමන හා යෝජනා 97

**5.1.** නිගමන 97

**5.2.** යෝජනා 100

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 103

| මාතෘකාව | පිටු අංක |
| --- | --- |

**ඇමුණුම්**


ඇමුණුම 01 - රත්නපුර දිස්ත්‍රික්කයේ පොලිස් ස්ථාන 112

ඇමුණුම 02 - 2005 අංක 34 ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැලැක්වීමේ පනත 113

ඇමුණුම 03 - 1995 අංක 22 දරණ දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත 127

ඇමුණුම 04 - සම්මුඛ සාකච්ඡා උප ලේඛණය 146

# වගු සටහන්


| වගු අංකය | වගුවේ නම | පිටුව |
|---|---|---|
| වගු අංක **1.1** | පොලිසිය මගින් අධිකරණ ක්‍රියාමාර්ග ගත් ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා - 2006-2015 | 2 |
| වගු අංක **1.2** | පොලිස් කොට්ඨාස අනුව වාර්තා වූ පවුල් ආරවුල් සංඛ්‍යාව - 2010-2015 | 3 |
| වගු අංක **3.1** | රත්නපුර පොලිස් කොට්ඨාසයේ පොලිස් ස්ථානවලට වාර්තා වූ පවුල් ආරවුල් - 2010-2015 | 61 |
| වගු අංක **3.2** | රත්නපුර පොලිස් කොට්ඨාසයේ තෝරාගත් පොලිස් ස්ථානයන්ට වාර්තා වූ පවුල් ආරවුල් 2015 ජනවාරි සිට අගෝස්තු දක්වා. | 63 |
| වගු අංක **4.1** | වින්දිතයන්ගේ වයස | 68 |
| වගු අංක **4.2** | වින්දිතයන්ගේ විවාහයේ ස්වභාවය | 69 |
| වගු අංක **4.3** | අපරාධකරු වින්දිතයාට ඇති ඥාතිත්වය | 69 |
| වගු අංක **4.4** | ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියාව | 70 |
| වගු අංක **4.5** | ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියාවට බලපාන ලද හේතු | 70 |
| වගු අංක **4.6** | ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියාවන්ගෙන් පවුලේ කෘත්‍යයන්ට සිදුවන බලපෑම | 72 |

# රූප සටහන්


| අනු අංකය | රූප සටහනේ නම | පිටුව |
|---|---|---|
| 3.1 | සිද්ධි අධ්‍යයනයන් සඳහා නියැදිය තෝරා ගත් ආකාරය | 63 |
| 4.1 | ගෘහස්ථ හිංසනයන්ට හේතු අතර අන්තර් සබඳතාව | 79 |
| 4.2 | ගෘහස්ථ හිංසනය සඳහා බලපාන ප්‍රධාන හේතු, ගෘහස්ථ හිංසන ක්‍රියා සඳහා පෙළඹීම් සාධක සහ පවුලේ විසංවිධානය අතර සම්බන්ධතාව | 91 |
| 5.1 | ගෘහස්ථ හිංසන ක්‍රියා | 98 |
| 5.2 | ගෘහස්ථ හිංසනය සඳහා බලපාන හේතු | 98 |
| 5.3 | වින්දිතයන්ගේ රැකියාවේ ස්වභාවය | 99 |

# ස්තුතිය

ශාස්ත්‍රීය ඥානයට නව දැනුමක් එක් කිරීමට මෙම අධ්‍යයනය සාර්ථක කරගැනීම සඳහා මා දිරිගන්වමින් මෙම කාර්යය සඳහා මාර්ගෝපදේශය ලබාදුන් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය උදයකුමාර අමරසිංහ මහතාට මාගේ කෘතඥතා පූර්වක ස්තුතිය පිරිනමමි. එසේම අධ්‍යයනයට අදාළ දත්ත රැස්කිරීම සඳහා සහාය වූ සහායකයන්ටද නන් අයුරින් සහයවූ සියලු දෙනාද ස්තුති පූර්වකව සිහිපත් කරමි.

එසේම අධ්‍යයන ක්ෂේත්‍රයේදී දත්ත රැස් කිරීම සඳහා සහාය ලබා දුන් රත්නපුර දිස්ත්‍රික්කයේ රත්නපුර, අහැලියගොඩ, කහවත්ත, නිවිතිගල හා ගොඩකවෙල පොලිස් ස්ථානවල ස්ථානාධිපතිවරුන් සහ කාන්තා හා ළමා කාර්යංශයන්හි ස්ථානාධිපතිවරු මෙන්ම දත්ත රැස් කිරීමට දායක වූ සෙසු පොලිස් නිලධාරීන් හටද ස්තුතිවන්ත වෙමි.

මීට අමතරව මෙම පර්යේෂණය සඳහා තොරතුරු ලබාදුන් දත්තදායිකාවන් හටද කෘතඥතාව පළ කරමි. නමින් සඳහන් නොකළද මෙම අධ්‍යයනයේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා සහාය වූ සියලු දෙනා ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

# සාරාංශය

ධනවාදී ආර්ථික, සමාජීය පරිසරය තුළ දකුණු ආසියාතික රටක් වන ශ්‍රී ලංකාව වර්තමානයේ විවිධ අභියෝගවලට මුහුණ දෙමින් සිටියි. එවැනි අභියෝග අතරින් පවුල් පරිසරය ආශ්‍රිතව පැන නගින ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය ප්‍රධාන ගැටලුවක් බවට පත්ව තිබේ. මානව සමාජයේ කුඩාම ඒකකය වන පවුලේ කෘත්‍යයන් සඳහා ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය හේතුවෙන් ඇති කරන බලපෑම ඉතා ප්‍රබලය. ඒ අනුව වේගයෙන් ඉහළ යන ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව සිදුවීම් හේතුවෙන් පවුල් සංස්ථාවේ පැවැත්ම අභියෝගයට ලක්වී ඇත. එහි ප්‍රතිඵලයන් ලෙස ළමයින්ගේ සමාජානුයෝජන ක්‍රියාවලිය ආශ්‍රිතව විවිධ ගැටලු ඇතිවීම හා පෞරුෂ සංවර්ධනය අඩාලවීම සිදුවේ. මෙම තත්ත්වය සමාජයේ සාමකාමී පැවැත්ම කෙරෙහි විවිධ බාධාවන් ඇති කරනු ලබයි. එබැවින් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සමස්ත සමාජයටම බලපාන අපගාමී සමාජ සංසිද්ධියක් මෙන්ම අපරාධකාරී චර්යාවක් ලෙස හඳුනා ගනිමින් කාන්තාවන්ට එරෙහිව සිදුවන ගෘහස්ථ හිංසනයන් පවුලේ විසංවිධානයට බලපාන ආකාරය පිළිබඳව මෙම පර්යේෂණය මඟින් අධ්‍යයනට භාජනය කරන ලදි.

ගුණාත්මක මෙන්ම ප්‍රමාණාත්මක දත්ත විශ්ලේශණයක් මගින් සිදුකල මෙම අධ්‍යයනයේ ප්‍රධාන අධ්‍යයන විධික්‍රමය ලෙස සිද්ධි අධ්‍යයන ක්‍රමය තෝරාගෙන ඇත. පර්යේෂණ ක්ෂේත්‍රය ලෙස යොදා ගන්නා ලද්දේ රත්නපුර දිස්ත්‍රික්කයේ පොලිස් බල ප්‍රදේශ පහකි. 2015 වර්ෂය තුළ එම පොලිස් බල ප්‍රදේශයන්හි පිහිටි පොලිස් ස්ථාන වෙත වාර්තා වූ ගෘහස්ථ ප්‍රචණ්ඩ සිදුවීම් පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කරමින් මෙම පර්යේෂණය සිදුකරන ලදි. එහිදී අදාළ කාලසීමාව තුළ තෝරා ගන්නා ලද පොලිස් ස්ථාන වෙත වාර්තා වූ ගෘහස්ථ ප්‍රචණ්ඩ සිදුවීම් අතුරින් සසම්භාවී නියැදි ක්‍රමය මගින් තෝරා ගත් ලද නියැදියක් ආශ්‍රයෙන් සිදු කරන ලද පර්යේෂණය මඟින් අනාවරණය වූ ප්‍රධාන සාධකයක් වූයේ මද්‍යසාර භාවිතය හේතුකොට ගෙන ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පැන නගින බවත් එය පවුල් විසංවිධානයට ප්‍රධාන වශයෙන් බලපා ඇති බවය. එසේම පවුලේ පුරුෂයාගේ අනියම් සම්බන්ධතාවන් හා බිරිඳ විසින් අනියම් සම්බන්ධතා පවත්වන්නේ යැයි පුරුෂයා විසින් ඇති කරගන්නා සැකය ගෘහ පරිසරය තුළ ප්‍රචණ්ඩත්වය වර්ධනය වීමට බලපා ඇති තවත් ප්‍රධාන සාධකයන් වී තිබේ.

ඒ අනුව මෙවැනි සාධක මූලික කොට ගනිමින් පැන නගින්නා වූ ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව සිදුවීම් පවුලේ වැඩිහිටි සාමාජිකයන්ට මෙන්ම ළමයින් සම්බන්ධයෙන්ද අහිතකර බලපෑම් එල්ල කොට ඇත. මෙම තත්ත්වය හේතු කොට ගෙන පවුල් සංස්ථාවේ කෘත්‍යයන් බිඳ වැටී ඇති බවත්,

ඒ හේතුවෙන් පවුල් විංසවිධානයට පත්ව ඇති බවත් මෙම පර්යේෂණය මඟින් අනාවරණය වූ අතර මෙම පර්යේෂණාත්මක නිබන්ධනය මගින් මෙම තත්ත්වය අවම කිරීමට යෝජනාද ඉදිරිපත් කිරීම සිදුවිය.